

# සාදයක් හා සංවාදයක්

ප්‍රේමවංශ දසනායක
ඇල්ටෝනා, වික්ටෝරියා.

මැදියම් රැය පසු වී ඇත
සාදය තව නිමවී නැත
කන් පුරවන සංගීතය
රැව් පිළිරැව් දෙයි දස අත

උඩු වියනේ කරකැවෙනා
පහන් කූඩුවෙන් පෙරෙනා
ආලෝකය හතර වටේ
රටා මවයි ඇස බඳිනා

පාට පාට සේද වලා
සලු පිළි අබරණ ඇඟ ලා
සැරසි සිටිති අඟනාවෝ
ප්‍රිය මනාප බැලූම් හෙලා

රහමෙර තොල කට ගෑවී
ගත සිත නැති වෙර මතු වී
කට මැත දොඩවති තරගෙට
පිරිමි දනෝ හැඩි දැඩි වී

ගතවන හැම හෝරාවේ
රසමසවුලූ කුස පිරවේ
අතිනත යන මධු විත හා
නිදි බර හිස බමනය වේ

කා බී සැනහී විඩා පත්වු ගත
තැන්පත් වන විට සුව අසුනක් මත
නිදා සිටිය සිත සැනෙකින් අවදිව
හඹා දුවයි ගම රට වෙත නොනැවත

කුසට අහර හැඳිවත පිරි මැහුමට
දහදිය වගුරන දවස පුරාවට
දනන් ගහණ ලොව නොබලා ඒ දෙස
ඔබ අද සිත කය පිනවනු කෙලෙසට

මිනිස් බවේ පොදු අරමුණු වපුරා
කාලයෙ ශ්‍රමයේ දර දිය සපුරා
මෙහෙයක් කරනට රටේ ජීවයට
කොයිබද ඔබ දුන් පොරොන්දු දිවුරා

පෙර දින ඔබ අත සවිකල මව් බිම
බලා හිඳී ඔබ දෙස නිරතුරුවම
ගෙවී මැකී යන දිනයක් පාසා
නොගෙවී එකතුවන ඔබ නය ගැතිකම

ඔප මට්ටම් කළ පිඟන් ගඩොලූ නැත
මුදු පහසට බුමුතුරුණු එලා නැත
එනමුදු ගෙයි පිළ ඔබ පා දැවටුන
අද දු ඔබට උණුසුම ගෙන දෙනු ඇත

## ලොකු දුව

මාලනී ද සිල්වා

මැදින් මස හත් වන දිනට
උපන් දින සමරණා විසි එක් වන වසර
දියණියනි අප සිත් පහන් කළ
ඔබයි අප දිවියම එකලූ කළ

දිදුලන තරුවකි ඔබ
අප සිත් අහස මැද
දස මසක් කුස දරා හිඳ
මෙලොව එළිය දුටු දා ඔබ
පිපුණි දහසක් මල් අප හදේ
මා මව් පදවිය ලැබු දිනේ

දිරිය දියණිය ඔබයි දියණියනි
සරසවි වරම් ලැබ
මේ දිගු දිවි ගමනේ
හොඳ නොහොඳ කියා දී
සෙවණැල්ලක් මෙන් ඔබ ළඟ ඉන්නම්
සසරේ උපදින බවය පුරා
දරුවකු වෙන්නට මගේ කුසේ
මලක් සේ පැහැපත්ව
විශ්වයම සුවඳ ගන්වන්න

ඝන කරුවලට පායන පුන් සඳ වාගේ
වටිනා මහඟු මැණිකකි අප හට ලෝකේ
තබන පයට සුවඳක් වී මලක් වගේ
පතමු පහන් වන්නට දිවි මග දූගේ

## ලොකු අය්යා

සරත් වීරසේකර
කැනඩාව

කරදරයක් දුකක් වූ විට ළඟින් උනී
අඩුවක් ලුහුඬුවක් වූ තැන උදව් වුනී
මරණය මගුලකදී හැමටම මුලින් උනී
හදවත රිදුන විටකදී වුව සිනහ වුනී

ජීවත් වුණේ තෙක් හැටහත් වෙනි වරුස
ගෙවු ජීවිතය විය හැමටම ආදුරුස
නැණ යහ ගුණ දමින් පිරිපුන් වූ පුරුස
සොබා දම උනේ කිම මෙතරම් පරුස

සැළකුවෙ හැමට පවුලේ නෑසියකු ලෙසා
හඳුනන අයකු නම් දැන තොරතුරු විමසා
සිය රැකියාව මහජන සේවය උදෙසා
කැප කළෙ බලාගෙන නොව තනතුරු පසසා

මමත්වය පෙරටු කරගත් ලෝකයක
මිනිසත්කම කිමැයි නොතකන සමාජෙක
සාධාරණය නීතිය යුක්තියගරුක
පුද්ගලයකු ලෙසින් නම පවතියි නිසැක

මරණය හැමට පොදුයි ඒකයි සොබා දම
එනමුත් ඔබ ගියේ තකහනියක්ම කිම
හත්මස ගත වුණත් තවමත් දැවෙයි ලැම
අයියේ සසර මග ඔබ කර ගන්න නිම

## බලමු මේ නයි නැටුම

අතුල විජේවික්‍රම

චාටුවට
හැව ගලවලා හරින
වාසියට
දිව දෙකේ වැඩකරන
මානයෙන්
පෙනේ පුප්පා රවන
සීරුවෙන්
බෙනේ ඇතුලට ඇදෙන

හැංගිලා
වාරෙ එනතුරු හිඳින
පිම්බිලා
පැලෙන්නට පෙර පිඹින
ළංවෙලා
මැරෙන්නට විෂ විදින
සිත් යොමා
බලමු මේ නයි නැටුම



## මමයි මගේ හිතයි

දිලිනි ඊරියවල

හඬද්දි මං හඬයි
සිනාවකදි දිලෙයි
කවක් වගේ හැඩයි
බසත් ඔහේ ගලයි

මමයි මගේ හිතයි
හැඟුම් වැලයි බසයි
ඔහේ හිතයි ලියයි
එකක් කියා හිතෙයි

*සිතුම් තානායම කාව්‍ය සංග්‍රහයෙන්*



## 1 වසර

චිරන්ත ජයසේන

සැම ළදල්ලක් ගානේ
අනත් දුක් බිඳු ඉහිරෙන
දුක් බර සබරගමු ඉම
කටු සර ගං දාරයක
රන් දිය ඉගෙහි සඟවන්
නිල් වන වතින් හිනැහෙන
කඳු පාමුලක හිටියා
ඔබ මඩපුතු පැමිණෙන තුරු

කර ගැට පැලූණු දෑතින්
මිට මොලවාන අග හිග
හෙමි හෙමින් අත අල්ලා
පුතු තුරුලටම ගත් දා
පියෙකුගේ නෙත් බොඳ වී
ප්‍රේමය ගලා හැළුණා
මිදුණු හිම පියලි ලෙසින
කිරි සුවඳ ඔබෙ උකුලත

චක්‍ර ලේඛන කියනා
ගිනි අව් තබා නළලට
දෙගුරුන්ව බිය ගන්වා
සිහිනය ම බොඳ කරවයි
උස් තක්ෂලාවන්ගේ
නෑරෙනා රන් දොරටුව
පසු දොරෙන් විසි කරනා
කාසියට විවරව යයි
මේ මුඩු බිමේ හඬනා
දිළිඳු ම බිළින්දන් හට
නුඹ වැනි මවුන් සරණයි

කිරි සිහින ඇහැරෙන තුරු
කවි කතන්දර කියනා
අත්තම්මෙකුගෙ උකුලයි
නුඹෙ තුරුල විදු මවුනි
ජය මගෙහි ඔබ තබනා
ගැඹුරු ම පිය සටහනක
එක් මගුල් ලකුණක් ඇඳ
නිසැකවම ඔහු ඉගිලෙයි
ඔබ වෙතින් නිල් අහසට
සුබ දිනෙක මතු එළඹෙන

boondi.lk

## දැක්ම

බෝගන බෝකන්ද

දැක මැණික් වැස්සක්
වසිනයුරු
සිටියේය
හේ
හේබාගිය වතින්
වසා නෙත් පියන්

සදාකාලික
කඳුළු වැස්සක
තෙමෙන්නට ඇති
බියෙන්

*තුරක කඳුළු ඳ 2010*
boondi.lk

## සිහිනෙකින් හමුවුණා වගෙයි

හේමා කටුකුරුන්ද
පැරිස්

සිහිනෙකින් ඔබ හමුවුණා වගෙයි මට
හමුවුණ මොහොතෙදි අහඹුවෙන්
අදහා ගන්නට බැරිවුණා එදින
ඒ ඔබමදැයි සත්තකින්

පුංචි කළලය සැඟවී තිබුණ ආදරේ
හිතට බරක් වී දැනුණා
මතක පොතට හිත දුවගියේ
අපේ අතීතය සොය සොයා

හැංගුණ වේලේ සඳ වළාකුලේ
ඔබ මට තුරුල් වුණා
ඒ සිහිනය ළඟ මතක පොතේ
හිත නැවතිලා අතරමං වෙලා